**කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීමේ හා ගම්පහ කාර්මික විද්‍යාලයෙහි ප්‍රමිතිය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය - 2018**

---

කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීමේ හා ගම්පහ කාර්මික විද්‍යාලයෙහි ප්‍රමිතිය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියෙහි 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා කොරියානු අපනයන-ආනයන බැංකුව අතර ඇතිකරගත් 2013 ජූලි 23 දිනැති ණය ගිවිසුම් අංක 203033එස්එල්-එස්ආර්අයි-22 හි විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීමේ හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. කාර්මික හුවමාරු හා ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීමෙහිලා ප්‍රධාන භූමිකාවක් නිරූපණය කිරීම හා මානව සම්පත් සංවර්ධනය සඳහා කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා ගම්පහ කාර්මික විද්‍යාලය පිහිටුවීම හා සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,083කට සමාන ඇ.ඩො. මිලියන 31.41ක් වූ අතර ඉන් රු.මිලියන 3,386 කට සමාන ඇ.ඩො. මිලියන 26.05 ක මුදලක් කොරියානු අපනයන-ආනයන බැංකුව මගින් මූල්‍යනය කිරීමට එකඟතාවය පළ කර ඇත. ඉතිරි මුදල වූ රු. මිලියන 697 කට සමාන ඇ.ඩො. මිලියන 5.36 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය.

2013 නොවැම්බර් 18 දින ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇති අතර එම කටයුතු 2016 නොවැම්බර් 18 වන විට අවසන් කිරීමට නියමිතය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2018 දෙසැම්බර් 31 දක්වා දීර්ඝකර ඇත.

## 1.3 මතය

කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීමේ හා ගම්පහ කාර්මික විද්‍යාලයෙහි ප්‍රමිතිය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියෙහි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා **රාජ්‍ය අංශයේ ගිණුම්කරණ** ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීමේ හා ගම්පහ කාර්මික විද්‍යාලයෙහි ප්‍රමිතිය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියෙහි මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශවය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමේ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මග හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධින් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

## 2.1 ව්‍යාපෘතියේ කටයුතු වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා ගම්පහ කාර්මික විද්‍යාලය සඳහා උපකරණ හා පහසුකම් සැපයීම, විදේශීය පුහුණුවීම් ලබාදීම, විශේෂඥයින් පිටත්කර යැවීම, පෙළ පොත් සංවර්ධනය හා උපදේශන සේවා ලබාදීම යන සංරචක 05 යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. ගොඩනැගිලිවල වැඩිදියුණු කිරීමේ හා ඉදිකිරීමේ කටයුතු 2019 මැයි 31 වන දින අවසන් කර ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වෙත භාර දී තිබුණි.

**කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිර්දේශය | බලපෑම | කළමණාකාරීත්වයේ ප්‍රතිචාරය | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය යෙදවීමේදී ඇතිවූ ප්‍රමාදවීම් හේතුවෙන්, 2013 නොවැම්බර් 18 වන දින ආරම්භ කරන ලද, 2016 නොවැම්බර් 18 වන දින වන විට අවසන් කිරීමට අපේක්ෂිත වූ පුහුණු මධ්‍යස්ථානවල ගොඩනැගිලිවල වැඩිදියුණු කිරීමේ හා ඉදිකිරීම් කටයුතු අවස්ථා 02 කදී 2018 දෙසැම්බර් 31 දක්වා දීර්සකර තිබුණි. | අධ්‍යයන පාඨමාලා නියමිත කාලය තුළ ආරම්භ කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධන කටයුතු අවසන් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍යවේ. |
| (ආ) | කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා ඔරුගොඩවත්ත ප්‍රදේශයේ සිදුවන ඉදිකිරීමේ කටයුතුවල වැඩ පරාසය වෙනස් කරනු ලැබ ඇති අතර 2019 අගෝස්තු 31 දිනට වෙනස් කිරීම් සඳහා වන ඇණවුම් 100 ක් පැවති අතර එහි ප්‍රතිඵලයක් ලෙස, ඇ.ඩො. මිලියන 8.54 ක් වූ ඉදිකිරීම් කටයුතුවල ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො. මිලියන 1.26 ක් | ඇස්තමේන්තු ඉක්මවමින් ඉදිකිරීම්වල පිරිවැය ඉහළ නැංවීමට ඇති හැකියාව | - එම - | ඉදිරියේදී මෙවැනි අවස්ථා අවම කර ගැනීම සඳහා සැලසුම් නිර්මාණයේදී ඇතිවන දුර්වලතා හා මිල වෙනස්වීමේලා ඇතිවන බලපෑම් විමර්ශනය කිරීම අවශ්‍යවේ. |

| | | | | |
|---|---|---|---|---|
| | දක්වා ඉහළ ගොස් තිබුණි. තවද, මූලික ඉදිකිරීම් සැලසුම්වලට ඇතුළත් කිරීමට අවශ්‍යවූ ශ්‍රවණාගාරයෙහි වායුසමීකරණ පද්ධතිය පිහිටුවීම, ගොඩනැගිලිවල මලාපවාහන පද්ධතිය, අභ්‍යන්තර මාර්ග හා හදිසි අවස්ථා සඳහා ගිනි දොර වැසුම් පද්ධතිය පිහිටුවීම, වෙනම, වෙනස් කිරීම සඳහාවන ඇණවුම් යටතේ සිදු කර තිබුණි. | | | |
| (ඇ) | 2018 නොවැම්බර් 30 දින වන විට සපයා පිහිටුවිය යුතු වූ ඇ.ඩො. මිලියන 4.67 ක් වටිනා විද්‍යාගාර උපකරණ හා ගොඩනැගිලි උපකරණ 2019 මැයි 09 වන දින සපයා තිබුණි. | අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම සඳහා ප්‍රමාදවීම් ඇතිවීමේ හැකියාව | එවැනි උපකරණවල පිරිවිතරවල වෙනස්වීම් හේතුවෙන් විද්‍යාගාර උපකරණ හා ගොඩනැගිලි උපකරණ ප්‍රමාදවීම් සහිතව සපයා තිබුණි. | අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම සඳහා ඉක්මනින් පියවර ගත යුතුය. |